# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දූෂණ අවධානම තක්සේරු කිරීමේ ආදර්ශ ආකෘතිය

| අවධානම | එය සිදු වීමට කෙතරම් ඉඩ තිබේද අඩු මධ්‍යම ඉහළ වශයෙන් 1 සිට 5 ලකුණු දෙන්න | එය සිදු වුවහොත් සිදුවිය හැකි හානිය අඩු මධ්‍යම ඉහළ වශයෙන් 1 සිට 5 දක්වා ලකුණු දෙන්න | පවත්නා ආරක්ෂක විධිවිධාන මොනවාද | පවත්නා ආරක්ෂණ විධිවිධාන කොතරම් ඵලදායා ද ඵලදායක/මධ්‍යස්ථ ඵලදායක නැත | කුමන අමතර ආරක්ෂක විධිවිධාන අවශ්‍යද |
|---|---|---|---|---|---|
| **ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය**<br><br>රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යන් ලෙස සිවිල් ලියාපදිංචිය,ලේඛන ලියාපදිංචිය,හිමිකම් ලියාපදිංචිය සිදුකරනු ලබයි. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ දිවයින පුරා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 50 ක් පිහිටුවා ඇත.එම කාර්යාල තුල ලේඛන ලියාපදිංචිය හා හිමිකම් ලියාපදිංචිය යන දෙකම සිදුවේ. ලේඛන ලියාපදිංචිය යටතේ සිදුවන්නේ නොතාරිස් වරයෙකු විසින් හෝ රජයේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද ඔපප්පු සහ වෙනත් (ඉඩමේ උපලේඛනයේ ඇතුලත් කරන ලද ලේඛන වේ) හිමිකම් ලියාපදිංචිය යටතේ හිමිකම ලියාපදිංචි කරනු ලබයි. | | | | | |
| 1. ලේඛන ලියාපදිංචි කිරීම | | | | | |
| ලේඛන ලියාපදිංචි කිරීම දෙපාර්තමේන්තුව තුල කඩිනම් සේවා හා සාමාන්‍ය සේවා යටතේසිදු කරනු ලබයි. කඩිනම් සේවා යටතේ නිශ්චිතව පැය 24 ක් ඇතුලත ලියාපදිංචි කර භාරදිය යුතුය.සාමාන්‍ය සේවා යටතේ දෙපාර්තමේන්තු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වර්ගීකරණය කර ලේඛනයක් ලියාපදිංචි කර ආපසු භාර දිය යුතු කාල පරාසයක් නිශ්චිතව දක්වා ඇත. නමුත් මේ අවස්ථාවේ දී අවම දින ගණනකින් ලියාපදිංචි කර භාරදීමේ හැකියාව තිබියදී කාල පරාසය තුල දක්වා ඇති උපරිම දින ගණන මෙම කාර්යය සඳහා යොදා ගැනීමට හැකිව ඇත. එහිදී යම් නිලධාරියෙකුට කාල පරාසයේ උපරිමයෙන් දී ඇති දිනයට පෙරාතුව වැඩය අවසන් කිරීම සඳහා මූල්‍යමය ප්‍රතිලාභයක් ලබා ගැනීමේ හැකියාව පවතී. එවැනි කියා අල්ලස් හා දූෂණයට ඉඩ ඇත. | 4 | 2 | කවුළුව වෙත ඔප්පු ලැබෙන පිළිවෙලට දින පොතට ඇතුළත් කර කොට්ඨාස හා පූර්වතාවය අනුව ලියාපදිංචියට බෙදා හැරීම . ලේඛන ලියාපදිංචි පනත,රෙගුලාසි, චක්‍රෙල්බ හා අත්පොතට අනුව කටයුතු කිරීම | මධ්‍යස්ථ | ආරක්ෂක කැමරා සවි කිරීම |
| | | | | | |
| 1සෙවීම් මේසය | | | | | |
| ලේඛනයක් ලියාපදිංචි කිරීම හෝ තමන්ගේ දේපළ සම්බන්ධව ලියාපදිංචි කර ඇති විස්තර සොයා ගැනීම සඳහා ඉඩමේ අයිතිකරුට හෝ ඔහු විසින් බලය පවතින ඕනෑම කෙනෙකුට පරීක්ෂා කිරීමට බලය ඇත. ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත මුදලක් අයකරනු ලබන අතර ඉල්ලුම් කරන ඉල්ලුම් පත්‍රයේ තමාට පරීක්ෂා කළ යුතු ඔප්පුව හෝ ඉඩම සම්බන්ධ පත්ඉරු නිශ්චිතව දැක්විය යුතුය.අය කරන ගාස්තුව එක් ඔප්පුවකට හා එක් ඉඩමකට අදාලව නිශ්වය කර ඇත. ලේඛන සෙවීම් මේසය සඳහා ලේඛන සැපයීමේදී කාර්යාල කාර්ය සහායකයින් විසින් ඉල්ලුම් කරනු ලබන ලේඛන වලට අතිරේකව වෙනත් ලේඛන සැපයීමට අවශ්‍ය තරම් ඉඩ ප්‍රස්ථා ඇත. මක් නිසාද අධීක්ෂණය සඳහා කාර්යාලයක ඇත්තේ සීමිත නිලධාරී පිරිසකි. ඉල්ලුම් කරන ලේඛන වලට අතිරේක ලේඛන සපයන කාර්යාල සහායක මහතුන් හට හා ඊට සම්බන්ධ නිලධාරීන් වෙත මුදල් ලබා ගැනීමට හැකියාව ඇත. එය රජයට සිදුවන බරපතල මූල්‍යමය පාඩුවකි. | 4 | 4 | ආරක්ෂක කැමරා සවි කර තිබීම සහ ඉඩම් රෙජිස්ට්‍රාර් හෝ අතිරේක දිසිත්‍රික් රෙජිස්ට්‍රාර්ගේ අධීක්ෂණය | මධ්‍යස්ථ | අභ්‍යන්තර කටයුතු ඒකකය මඟින් සවි කරන ලද දූෂණ විරෝධි කටයුතු සම්බන්ධයෙන් තොරතුරු දැනුම් දීමට උපදෙස් සහිත නාම පුවරු හා ස්ටිකර්පත් ඇලවීම |
| | | | | | |
| 111ලේඛනාගාර තුල ලේඛන සැපයීම | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ලේඛනාගාර භාරකරු විසින් රජයට නියමිත ගාස්තු ගෙවා ඉල්ලුම් පත්‍රයකින් ගෙවීම් කිරීම සඳහා ඉල්ලුම් කරන ලද ලේඛනයට අතිරේකව ලේඛන සැපයීමේදී හා කාර්යාල කාර්ය සහායකයින් විසින් ලියාපදිංචි පත්ඉරු පරීක්ෂා කිරීම සඳහා අතිරේක ලේඛන සැපයීමේදී රජයට ඉතුරුවිය යුතු මුදල අහිමි වන අතර එම මුදල නිලධාරීන් අතට පත් වේ. | 4 | | ඉඩම් රෙජිස්ට්‍රාර් /අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ අධීක්ෂණය | මධ්‍යස්ථ | ඔප්පු පිටපත් තැම්පත් කර ඇති ලේඛනාගාර තුළ සහ පරිබාහිරව ලියාපදිංචි ලේඛන රඳවා ඇති රාක්ක ආවරණය වන පරිදි ආරක්ෂක කැමරා සවි කිරීම. තව ද කොට්ඨාස හා නොතාරිස්වරුන්ගේ නමට අදාලව රාක්ක වලට ඇතුළත් කිරීම |
| | | | | | |
| iv.නිලධාරියා විසින් ඔප්පු පිටපත් සහ පත්ඉරු නිකුත් කිරීමේදී | | | | | |
| ඔප්පු පිටපත් හා පත්ඉරු නිකුත් කිරීම සඳහා එක් ඔප්පුවකට හා එක් පත්ඉරුවකට නියමිත මුදලක් නියම කර ඇත. අදාළ ඉල්ලුම් පත්‍රයේ  එකී විස්තර සැපයිය යුතු වුවද අධීක්ෂණ නිලධාරීන්ගේ ඌණතාවය හා යම් ප්‍රමාද දෝෂයකින් හෝ අතපසු වීමකින් කිරීම සිදුවීම මත අධික ඉල්ලුම්පත් සංඛ්‍යාවකට කටයුතු සිදුවීමට ඉඩ ඇති බවත් එසේ සිදුවුව හොත් අත්සන් සඳහා යොමු කරන මොහොතේ අත්රේකව බාහිර පාර්ශවයක අවශ්‍යතාවය මත අතිරේක ලේඛනයක් නිකුත් කිශීමට ඉඩ ඇ.ත. එසේ සිදුවුවහොත් රජයට පාඩුවක් මෙන්ම වෙනත් නිලධාරියෙකු හට ලැබිය හැක. | 4 | 2 | ඉඩම් රෙජිස්ට්‍රාර් /අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ අධීක්ෂණය | මධ්‍යස්ථ | ආරක්ෂක කැමරා සවි කිරීම |
| | | | | | |
| v.ලේඛන ලියාපදිංචියේ ආඥාපනතේ 35 වගන්තියට අනුව කටයුතු කිරීම | | | | | |
| ලේඛනයක් ලියාපදිංචි කිරීමේදී ලියාපදිංචි කරන අවස්ථාවේ නිලධරයෙකු අතින් සිදු වන වරදක් නිවැරදි කිරීම සඳහා ප්‍රතිපාදන ඇත. එහිදී මෙම නිත්‍යානුකූල ක්‍රම වේදය භාවිතා නොකර අවශ්‍යතාවය පවතින පුද්ගලයා හට වෙනත් නිලධරයෙකුට මුදලක් ලබා දී නිත්‍යායානුකූල ක්‍රමවේදයෙන් බැහැරව ලියාපදිංචිය ඇති විය හැකි සුළු වරදක් නිවැරදි කිරීම ට ඉඩකඩ පවතී. එහිදී රජයට මූල්‍යමය පැහැදිලිව සිදු නොවුවද අල්ලස් හා දූෂණය යන වරද සිදු වේ | 2 | 2 | කාර්යාලය තුළ පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශණය කිරීම | මධ්‍යස්ථ | ආරක්ෂක කැමරා සවි කිරීම |
| | | | | | |
| Vi.ලේඛන සකස් කිරීමේ ආඥාපනතේ 120 අධිකාරියට  අනුව කටයුතු කිරීම | | | | | |
| ලියාපදිංචි ලේඛනයක තොරතුරු දිරාපත් වී ඇත්නම් හෝ දිරාපත් වීමට ඉඩකඩ ඇත්නම් හෝ නියවීමට නොහැකි තත්වයේ ඇත්නම් මෙම ලේඛනය නැවත ප්‍රතිශ්ඨාපනය සඳහා ප්‍රතිපාදන සැළසේ. මෙහිදී රජයේ වියදමින් වසරකට ප්‍රතිපාදන ලබා දෙන්නේ ඉතා සීමිත වශයෙනි. ඉල්ලුම්කරුවන් වසරකට මේ සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය ප්‍රමාණාත්මක වශයෙන් වැඩිය තරමක් දිගි ක්‍රමවේදයක් යටතේ මෙය සිදු කල එහිදී අනුමත කරන නිලධාරියා මෙම රාජකාරං සඳහා සම්බන්ධවන පහළම නිලධාරියාගේ සිට ඉහළම නිලධාරියා දක්වා නීත්‍යානුකූලව මුදල් ලබා ගැනීමේ ඉඩකඩක් පවතින බව හඳුනාගෙන ඇත. | 3 | 2 | කාර්යාලය තුළ පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශණය කිරීම | මධ්‍යස්ථ | ආරක්ෂක කැමරා සවි කිරීම |
| | | | | | |
| 2.දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ජනරාල් අංශය | | | | | |
| දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විවිහ,උප්පැන්න මරණ ලියාපදිංචි සම්බන්ධව හා ඊට අනුශාංගික කාරණා සම්බන්ධව මෙන්ම පිටපත් නිකුත් කිරීම සඳහා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයක් ස්ථාපිත කර තිබේ.කොට්ඨාශ රෙජිස්ට්‍රාර්වරුන් විසින් උප්පැන්න,මරණ ලියාපදිංචි කිරීමේදී කඩිනමින් එහි නොමිලේ ලබා දෙන පිටපත ලබා දීම සඳහා පාර්ශවයන්ගෙන් මුදල් ලබා ගන්නා අවස්ථා හඳුනාගෙන ඇත. එමෙන්ම ඒවා තැපැල් තිරීම සඳහා මුදල් ලබා ගන්නා අවස්ථා හඳුනා ගෙන ඇත.  විවාහ ලියාපදිංචියේදී රජයේ නියමිත ගාස්තු වලට අමතරතව මුදල් ලබා ගන්නා අවස්ථා හෙළිදරව් වී ඇත. මෙහිදී අල්ලස් හා දූෂණය සිදුවීම තුල දෙපාර්තමේන්තුවට හානියක් සිදුවේ.විවාහ ලියාපදිංචියේ දී ප්‍රාේද්ශීය ලේකම් කාර්යාලවල ඇති දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් විසින් මෙන්ම කොට්ඨාශ රෙජිස්ට්‍රාර්වරුන් විසින් ද ගෘහ බලපත්‍ර ලබා නොගෙන එකී බලපත්‍ර මත ලියාපදිංචිය කල යුතු විවාහ තම කාර්යාලයේදී සිදු කරන ලදැයි සඳහන් කරමින් ලියාපදිංචි කළ අවස්ථා හඳුනාගෙන තිබේ. මෙමගින් රජයට මූල්‍යමය පාඩුවක් සිදුවන අතර දූෂණය සහ අල්ලස ද ත්‍රියාත්මක වීමට ඉඩකඩ පවතී. | | | | | |
| | | | | | |
| 1.උප්පැන්න විවාහ මරණ පිටපත් නිකුත් කිරීම | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් විවාහ උප්පැන්න මරණ පිටපත් නිකුත් කිරීමේදී පරිලෝකිත පිටපත් නිකුත් කිරීමේදී හැර 1960 ට පෙර පිටපත් ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරුවන් හට ඒවා ලේඛන සොයා බලා ලබා දිය යුතු අවස්ථාවලදී ලේඛන සොයන නිලධාරීන්ගේ හා ඊට සම්බන්ධ වෙනත් නිලධාරීන්ගේ අවශ්‍යතාවයන් මත එම ලේඛන දිරාපත් බවට හෝ ස්ථානගත බවට වු පිළිතුරු ලබා දීමේදී රජයට මූල්‍යමය පාඩුවක් හා දූෂණය යන කාරණය සිදුවේ. | 3 | 2 | ඉල්ලුම්පත් භාර ගන්නා කවුළු ආශ්‍රිතව ආරක්ෂක කැමරා සවි කර තිබීම සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්ගේ අධීක්ෂණය සිදු කිරීම. | මධ්‍යස්ථ | ලේඛනාගාරය තුළ ආරක්ෂිත කැමරා සවි කිරීම |
| | | | | | |
| 11.1960 පෙර ලේඛන සෙවීම් කිරීමේදී | | | | | |
| ලේඛන සෙවීම් කිරීම සඳහා අදාල පාර්ශවකරුවන්ට නියමිත ගාස්තු ගෙවා ලේඛන පරීක්සා කළ හැක. ඒ හැර රාජ්‍ය නිලධාරීන්ගේද වගකීමක් ලෙස ලේඛන සොයා පිටපත් ලබා දීම සිදුකළ යුතුය. ඉතා පැරණි ලේඛන සෙවීම් කිරීම සඳහා කාර්යාල කාර්ය සහායකයින් ඇතුළු ඊට සම්බන්ධ නිලධාරීන් හට අනියම් ලෙස මුදල් ලබා ගැනීමේ හැකියාව ඇත. | 2 | 3 | ඉල්ලුම්පත් භාර ගන්නා කවුළු ආශ්‍රිතව ආරක්ෂක කැමරා සවි කර තිබීම සහ අතිරේක | මධ්‍යස්ථ | ලේඛනාගාරය තුළ ආරක්ෂිත කැමරා සවි කිරීම |
| | | | | | |
| 111.උප්පැන්න මරණ සංශෝධනයට ඉල්ලුම් කිරීම | | | | | |
| උප්පැන්න මරණ සංශෝධනයට ඉල්ලුම්කිරීමේදී මේ සඳහා නියමිත ගාස්තුවක් හා ඒ සම්බන්ධ ලේඛන තහවුරු කිරීම සඳහා ලේඛන ලබා දීමේ ක්‍රමවේදයක් පවතී.නමුත් ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතාවය මත නීත්‍යානුකූල ක්‍රමවේදයෙන් බැහැරව මෙම සංශෝධනයන් සිදු කර දී ඇති අවස්ථා ඇත. ඒ සඳහා විශාල අල්ලසක් ලබා ගන්නා අතර රජයට මූල්‍යමය පාඩුවක් වේ. | 4 | 2 | උපත්, විවාහ,මරණ ලියාපදිංචි පනත,රෙගුලාසි,චක්‍රලේඛ හා අත්පොතට අනුව කටයුතු කිරීම | මධ්‍යස්ථ | ආරක්ෂිත කැමරා සවි කිරීම |
| | | | | | |
| iv.විවාහ ,උප්පැන්න සංශෝධන වලට අනුමැතිය ලබා දීමේදී | | | | | |
| උප්පැන්න හා මරණ අවශ්‍ය සංශෝධන සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ප්‍රතිපාදන පවතින අතර විවාහ සහතික සංශෝධනයට හැර අධිකරණයට ප්‍රතිපාදන පවතී. මේ යටතේ නීත්‍යානුකූල ත්‍රමාවිදයෙන් බැහැරව මෙම සහකින සංශෝධන කිරීම් හඳුනා ගෙන ඇත. මෙහිදී රජයට මූල්‍යමය පාඩුවක් සහ බරපතල දූෂණයක් වේ. | 4 | 2 | උපත්, විවාහ,මරණ ලියාපදිංචි පනත,රෙගුලාසි,චක්‍රලේඛ හා අත්පොතට අනුව කටයුතු | මධ්‍යස්ථ | ආරක්ෂිත කැමරා සවි කිරීම |
| | | | | | |
| v.උප්පැන්න ලේඛන පරිවර්ථනය කිරීම | | | | | |
| මේ සඳහා දෙපාර්තමේන්තු සුදුසුකම්ලත් නිලධාරීන් සීමිත පිරිසක් සිටින අතර නාර්යාලීය වේලාවෙන් පරිභාහිරව සිදුකල යුතු අතිරේක කාර්යයකි. මෙහිදී එම පරිවර්තනයන් පැය කීපයක් හෝ එදින කාර්යාල තුල දීම ලබා දීම සඳහා අතිරේකව නීත්‍යානුකූල නොවන මුදල් ලබාගත් අවස්ථා හඳුනාගෙන ඇත. | 3 | 4 | උපත්, විවාහ,මරණ ලියාපදිංචි පනත,රෙගුලාසි,චක්‍රලේඛ හා අත්පොතට අනුව කටයුතු කිරීම | මධ්‍යස්ථ | ලේඛන නිකුත් කිරීම හා උපපත්‍රිකා ගොනු ආපසු භාර ගැනීම සම්බන්ධව අධීක්ෂණයට නිලධාරියෙක් පත් කිරීම හා ආරක්ෂිත කැමරා සවි කිරීම |
| | | | | | |
| vi.උප්පැන්න මරණ පනතේ 12.1 වගන්තිය යටතේ | | | | | |
| දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාකර්යාල තැන්පත් කර ඇති උප්පැන්න මරණ ලේඛනයක් අස්ථානගත හෝ දිරාපත් වී ඇති අවස්ථාවක එම ලේඛනයේ දෙවන පිටපත තැන්පත් කර ඇති මධ්‍යම ලේඛනාගාරයෙන් මෙම වගන්තිය යටතේ පිටපතක් නිකුත් කරනු ලැබේ. මේ සඳහා නියමිත ගාස්තු ගෙවා ක්‍රමවේදයක් තුළ ඉල්ලුම් කළ යුතු වුවද අනියම් ආකාරයකින් නියමිත ක්‍රමවේදයන්ගෙන් බැහැරව එය ලබා ගන්නා ඒ සඳහා නීත්‍යානුකූල නොවන ලෙස මුදල් ලබා ගත් අවස්ථා හඳුනා ගෙන ඇත.ශ්‍රී ලාංකිකයින්තේ විදේශයන්හි දි සිදුවන උප්පැන්න මරණ ලියාපදිංචි කිරීම් විවාහ,උප්පැන්න,මරණ සහතික වල සංශෝධන සඳහා අනුමැතිය දීම. මෙම කාරණා සඳහා අනුමැතිය ලබා දීමේදී හා ලේඛන සෙවීම් කිරීමේදී හා නිකුත් කිරීමේදී නියමිත නීත්‍යානුකූල ක්‍රම වේදයන්ගෙන් බැහැරව සිදු කළ අවස්ථා හඳුනාගෙන ඇත. එහිදි රජයට මූල්‍යමය පාඩුවක් හා දූෂණය සිදුවේ. | 3 | 2 | උපත්, විවාහ,මරණ ලියාපදිංචි පනත,රෙගුලාසි,චක්‍රලේඛ හා අත්පොතට අනුව කටයුතු කිරීම | මධ්‍යස්ථ | ආරක්ෂිත කැමරා සවිකිරීම හා නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් සහ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අධීක්ෂණය |
| | | | | | |
| 3.ශ්‍රී ලංකාව තුල විදේශිකයින්ගේ විවාහ සිදු කිරීම | | | | | |
| මේ සඳහා සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ හා මුස්ලිම් විවාහදික්කසාද ආඥාපනත යටතවේවාහ ලියාපදිංචි සඳහා ඉල්ලුම් කිරීමේදී එය ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී සිදු කිරීමට සකස් කර ඇති ක්‍රමාවිදය තුල ඒ සඳහා අනුමැතිය ලබා දීමේදී අල්ලස් හා දූෂණය ක්‍රියාත්තමක වීමට ඉඩකඩ ඇත. | 3 | 3 | විවාහ ආඥාපනත්, රෙගුලාසි, චක්‍රෙල්ඛ හා අත්පොත අනුව කටයුතු කිරීම | මධ්‍යස්ථ | විවාහයට අදාල පාර්ෂවයෙන් පමණක් ලියවිලි භාරදීම සඳහා අවසර දීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |
| 4.කොට්ඨාශ රෙජිස්ට්‍රාර්වරුන්ගේ විවාහ | | | | | |
| කොට්ඨාශ රෙජිස්ට්‍රාර්වරුන්ගේ විවාහ කටයුතු සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී පක්ෂපාතී ලෙස කටයුතු කළ අවස්ථා හඳුනාගෙන ඇත. මෙහිදී අල්ලස හා දූෂණය ක්‍රියාත්මක වීමට ඉඩකඩ පවතිනවාක් මෙන්ම වැරදි සිදු කරනු ලබන රෙජිස්ට්‍රාර්වරුන් වෙත තව දුරටත් රජයේ දීමනා ගෙවීම තුල මූල්‍යමය පාඩුවක් සිදුවේ. | 5 | 2 | උපත්, විවාහ,මරණ ලියාපදිංචි පනත,රෙගුලාසි,චක්‍රලේඛ හා අත්පොතට අනුව කටයුතු | මධ්‍යස්ථ | කාර්යාල අධීක්ෂණය හා පරීක්ෂාව නිරන්තරයෙන් සිදු කිරීම |
| | | | | | |
| 5.ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචිය | | | | | |
| දිවයිනේ කලාප මට්ටමින් පිහිටුවා ඇති කලාප මට්ටමින් හා දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර්ජනරාල් කාර්යාල වල ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචිය සිදදුකරනු ලබයි. මෙහිදී ද කඩිනම් හා සාමාන්‍ය සේවා යටතේ ලියාපදිංචි කිරීම් සිදු කරන අතර ඒ සඳහා ගත වන නිශ්චිත කාලයක් සහ නිශ්චිත මුදලක් අයකර ගනී. සාමාන්‍ය සේවා යටතේ දක්වා ඇති කාල පරාසයන් තුළ දී අවම කාල පරාසයක් තුල ලියාපදිංචි කර දීම සඳහා මුදලක් නීත්‍යානුකූල නොවන මුදලක් ලබා ගැනීමට හැකියාව පවතී. එහිදී රජයට මූල්‍ය පාඩුවක් සිදු වීමට ඇති ඉඩ ප්‍රස්ථා ද නිර්මාණය වේ. | 4 | 2 | ඇටෝර්නි බලපත්‍ර පනත අනුව කටයුතු කිරීම | මධ්‍යස්ථ | නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් අධීක්ෂණය හා ආරක්ෂිත කැමරා සවි කිරීම |
| | | | | | |
| 6.මෝටර්රථ අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම | | | | | |
| නියමිත ක්‍රමවේදයන් හඳුන්වා දී ඇති නමුත් ඉන් බැහැරව අනියම් ආකාරයට නිලධාරීන් අතට මුදල් හුවමාරු වීමට ඉඩ ප්‍රස්ථා මේ තුල ඇති බව හඳුනා ගෙන ඇත. | 4 | 4 | මුදල් රෙගුලාසි, චක්‍රෙල්ඛ හා අත්පොත අනුව කටයුතු කිරීම | මධ්‍යස්ථ | වාහන අංගනයට ආරක්ෂිත කැමරා සවි කිරීම හා නිරන්තර අධීක්ෂණයට මාණ්ඩලික නිලධාරියෙක් පත් කිරීම |
| | | | | | |
| 1.ඉන්ධන පිරිවැය ගණනය කිරීමේදී (ධාවන සටහන් සමඟ) | | | | | |
| දෙපාර්තමේන්තුවේ භාවිතා කරනු ලබන වාහන වාර්ෂිකව ඉන්ධන පරීක්ෂාවකට ලක්කිරීම සිදු කරනු ලබයි. කෙසේ වෙතත් මෙහිදී සත්‍ය ඉන්ධන දහනය පිළිබඳව ගැටළුකාරී තත්වයන් හඳුනාගෙන ඇත. ඒ තුළ රජයට මූල්‍යමය පාඩුවක් සිදුවෙ. | 4 | 3 | මුදල් රෙගුලාසි, චක්‍රෙල්ඛ හා අත්පොත අනුව කටයුතු කිරීම | මධ්‍යස්ථ | වාර්ෂිකව හෝ අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක මෝටර් රථ දෙපාරතමේන්තුව සහභාගීත්වයෙන් ඉන්ධන පරීක්ෂාව සිදු කිරීම |
| | | | | | |
| 7.යන්ත්‍ර සූත්‍ර නඩත්තු | | | | | |
| දෙපාර්තතෙතම්න්තුවේ යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණික උපකරණ මෙන්ම කාර්යාල උපකරණ නඩත්තු කිරීමේදී සිදු කරනු ලබන අලුත්වැඩියා කටයුතු හා සේවාතුළ දී රජයට මූල්‍යමය පාඩු වන අවස්ථා හඳුනාගෙන ඇත. | 3 | 3 | මුදල් රෙගුලාසි, චක්‍රෙල්ඛ හා අත්පොත අනුව කටයුතු කිරීම | මධ්‍යස්ථ | ආරක්ෂිත කැමරා සවි කිරීම |
| | | | | | |